ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ අධ්‍යයන අංශය
සමාජ විද්‍යා උසස් සහතික පත්‍ර පාඨමාලාව - 2021/2022
2 වන මට්ටම - I වන වර්ෂාර්ධය
අවසාන පරීක්ෂණය
DSC2812 - ආර්ථික විද්‍යාවේ මූලිකාංග

දිනය: 2022 ජුනි 05 වේලාව: ප.ව. 01.30 - ප.ව. 04.30

උපදෙස් :

1. ප්‍රශ්න පහකට (05ට) පමණක් පිළිතුරු සපයන්න.

2. සෑම ප්‍රශ්නයකටම ලකුණු විස්ස (20) බැගින් ලැබේ.

3. ඔබගේ පිළිතුරු පැහැදිලිව ලියන්න.

1.

(a) "ආර්ථික විද්‍යාව යනු හිඟකම පවතින ලෝකයක, තේරීම් පිළිබඳ කරනු ලබන අධ්‍යනයකි" මෙම ප්‍රකාශය උදාහරණ ආශ්‍රිතව විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

(b) ඔබ විසින් මාසික වේතනය/ආදායම වුවමනා/අවශ්‍යතා සපුරාලීමට වියදම් කරන්නේ කෙසේද ? ආර්ථික මූලධර්ම ආශ්‍රිතව සැකෙවින් පහදන්න. (ලකුණු 10)

2.

(a) ඕනෑම ආර්ථිකයක් විසින් විසඳිය යුතු මූලික ආර්ථික ප්‍රශ්න මොනවාද? (ලකුණු 04)

(b) මෙම ආර්ථික ප්‍රශ්ණ විවිධ ආර්ථික ක්‍රම මඟින් විසඳන්නේ කෙසේදැයි පහදන්න. (ලකුණු 16)

3.

(a) ඉල්ලුමෙහි වැඩිවීම සහ ඉල්ලුම් ප්‍රමාණයෙහි වැඩි වීම අතර වෙනස කුමක්ද? (ලකුණු 05)

(b) සැපයුම වෙනස් වීමට බලපාන සාධක විස්තර කරන්න. (ලකුණු 15)

4. පහත දක්වා ඇති Caravan Fast Food ආයතනයේ දවසක් තුළ සැන්ඩ්විච් සඳහා පවතින ඉල්ලුම් – සැපයුම් ලේඛනය දෙස බලන්න.

| සැන්ඩ්විචයක මිල රු. | ඉල්ලුම් ප්‍රමාණය / දවසක | සැපයුම් ප්‍රමාණය / දවසක |
|---|---|---|
| 55 | 250 | 550 |
| 50 | 300 | 500 |
| 45 | 350 | 450 |
| 40 | 400 | 400 |
| 35 | 450 | 350 |
| 30 | 500 | 300 |
| 25 | 550 | 250 |

(a) ඉහත සඳහන් තොරතුරු භාවිතා කොට ඉල්ලුම් හා සැපයුම් වක්‍ර අඳින්න. සියලුම තොරතුරු පැහැදිලිව ප්‍රස්ථාරගත කරන්න. (ලකුණු 04)

(b) සමතුලිත මිල හා ප්‍රමාණය කුමක්ද? (ලකුණු 02)

(c) ප්‍රස්ථාරය භාවිතා කොට සැන්ඩ්විච් වල අතිරික්තයක් (Surplus) ඇති වන ආකාරය පෙන්වන්න. එවිට සමතුලිත මිලෙහි ඇති වන වෙනස යථා තත්වයට පත් වන්නේ කෙසේද? (ලකුණු 04)

(d) වෛද්‍යවරුන් විසින් සැන්ඩ්විචස් පරිභෝජනය සෞඛ්‍යයට හිතකර බව පවසයි. මෙය සමතුලිත මිල හා ප්‍රමාණය වෙනස් කරනු ලබන්නේ කෙසේද? (ලකුණු 05)

(e) පාන් මිලෙහි ඇතිවන හදිසි වැඩි වීමක් සැන්ඩ්විච් වල සමතුලිත මිල හා ප්‍රමාණයට ඇති කරනු ලබන්නේ කෙබඳු බලපෑමක්ද? (ලකුණු 05)

5.

(a) පූර්ණ තරඟකාරී වෙළඳපලක දක්නට ලැබෙන මූලික ලක්ෂණ සැකෙවින් සාකච්ඡා කරන්න (ලකුණු 10)

(b) "ඒකාධිපති වෙළඳපලක දක්නට ලැබෙන විශේෂ ලක්ෂණය වන්නේ මිල විශේෂීකරණයයි." මෙම ප්‍රකාශය විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

6.

(a) ජාතික ආදායම ගණනය කිරීමෙහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 08)

(b) ජාතික ආදායම ගණනය කිරීම සඳහා යොදාගනු ලබන එක් ප්‍රවේශයක් විස්තර කරන්න. (ලකුණු 12)

7.

(a) සේවා වියුක්ති වර්ග හතරක් (04ක්) උදාහරණ ආශ්‍රිතව සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(b) ඇතැම් රටවල් වල සේවා වියුක්තිය ප්‍රධාන සාර්ව ආර්ථික ගැටලුවක් වන්නේ ඇයි? (ලකුණු 12)

8.

(a) ආර්ථික වර්ධනය සහ සංවර්ධනය අතර පවතින වෙනස කුමක්ද? (ලකුණු 05)

(b) ඉහල ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට ඌන සංවර්ධිත රටවලට ඇති ප්‍රධාන අභියෝග මොනවාද? (ලකුණු 15)

9. පහත දෑ අතුරින් ඕනෑම **හතරක් (04ක්)** පිළිබඳව කෙටි සටහන් ලියන්න. අවශ්‍ය පරිදි ප්‍රස්ථාර, උදාහරණ භාවිතා කරන්න. (ලකුණු 05 බැගින්)

(a) අභ්‍යන්තරාභිමුඛ ප්‍රතිපත්ති
(b) නිෂ්පාදන සාධක
(c) ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය
(d) පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය
(e) ඉල්ලුම් න්‍යායය
(f) මිල සීමා

*** සියලුම හිමිකම් ඇවිරිණි ***